# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## එකතු කළ අගය මත බදු (සංශෝධන)

**2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

මුදල් අමාත්‍යතුමා විසින් 2022 ජනවාරි මස 20 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2022 ජනවාරි මස 07 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

**[102 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 12.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 25ඇ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, මූල්‍ය ආයතන විසින් සපයනු ලබන මූල්‍ය සේවාවන් මත වන බදු අනුප්‍රමාණය 2022 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි 15% සිට 18% දක්වා වැඩි කිරීම වේ.

***3 වන වගන්තිය*** : 2022 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා ඇතැම් භාණ්ඩ සහ සේවාවන් එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කිරීම සඳහා මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ II වන කොටස සංශෝධනය කරනු ලැබේ.

# එකතු කළ අගය මත බදු (සංශෝධන)

එල්.ඩී.-ඕ. 51/2021

**2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ**:-**

ලුහුඬු නාමය

**1.** මේ පනත 2022 අංක     දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2002 අංක 14 දරන පනතේ 25ඇ වන වගන්තිය සංශෝධනය කිරීම

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 25ඇ වන වගන්තියේ (3) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේඃ-

(1) එම උපවගන්තියේ (ඊ) ඡේදයේ "2016 නොවැම්බර් මස 1 වන දිනෙන් ආරම්භ වන කාලසීමාව සඳහා සියයට පහළොවක් විය යුතු ය." යන වචන සහ ඉලක්කම් වෙනුවට "2016 නොවැම්බර් මස 1 වන දිනෙන් ආරම්භ වන එහෙත් 2021 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන කාලසීමාව සඳහා සියයට පහළොවක් විය යුතු ය;" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;";

(2) එම උපවගන්තියේ (ඊ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්:-

"(උ) 2022 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු සියයට දහඅටක් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ II වන කොටස පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේඃ-

(1) එම කොටසේ (අ) ඡේදයේ-

(අ) එම ඡේදයේ (xxxi) වන අයිතමයේ "2020 මැයි මස 20 වන දින සිට බලාත්මක වන පරිදි" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2020 මැයි මස 20 වන දින සිට බලාත්මක එහෙත් 2021 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන පරිදි" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;";

(ආ) (xxxi) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන්:-

"(xxxii) සෞඛ්‍යය විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිර්දේශ කර මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද පරිදි, 2022 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු යම් වසංගත තත්ත්වයක් හෝ මහජන සෞඛ්‍ය සම්බන්ධයෙන් වන හදිසි තත්ත්වයක් හමුවේ කටයුතු කිරීමට සෞඛ්‍ය සේවා සැපයීම සඳහා අවශ්‍ය වන්නා වූ ද යම් රජයේ රෝහලකට හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද්දා වූ ද වෛද්‍ය උපකරණ, යන්ත්‍ර සූත්‍ර, තාක්ෂණික උපකරණ, උපාංග සහ ඒවායේ කොටස්, රෝහල් ගෘහ භාණ්ඩ, ඖෂධ සහ රසායනික ද්‍රව්‍ය.";

(2) (ඕ) ඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ඕ) යෙදවුම් බද්ද සඳහා හිමිකම්පෑම් ඉදිරිපත් කර ඇති යම් බදු දීමනාකරුවකු විසින් නැවත බුක්තියට ගැනීමෙන් පසු බැහැර කරන ලද සහ 2014 ඔක්තෝබර් මස 25 වන දිනට පෙරාතුව එළඹෙන ලද යම් කල්බදු ගිවිසුමක් යටතේ සපයන ලද යම් මෝටර් වාහනයක් හැර, ආනයනය කරනු ලබන හෝ සපයනු ලබන-

(අ) රේගු කාර්ය සඳහා සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගත් ආනයනය කිරීමේ දී-

(i) 2014 ඔක්තෝබර් මස 25 වන දින හෝ එදිනට පසු 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නිෂ්පාදන බද්දට යටත්වන; හෝ

(ii) 2022 අංක දරන විශේෂ භාණ්ඩ හා සේවා බදු පනත යටතේ පනවන ලද විශේෂ භාණ්ඩ හා සේවා බද්දට යටත්වන,

සහ නිෂ්පාදනය කිරීමේ දී එම බද්දට ම යටත්වන එවැනි යම් මෝටර් වාහනයක්;

(ආ) 2014 ඔක්තෝබර් මස 25 වන දිනට පසු ආනයනය කරන ලද හෝ නිෂ්පාදනය කරන ලද (අ) අනුඡේදයේ (i) වන අයිතමයේ දක්වා ඇති බද්දට යටත් විය හැකිව තිබූ යම් මෝටර් වාහනයක්, 2014 ඔක්තෝබර් මස 25 වන දිනට නොවිකිණී ඉතිරිව පවතින යම් මෝටර් වාහනයක්;

(ඇ) ආනයනය කරනු ලබන හෝ සපයනු ලබන,රේගු කාර්ය සඳහා සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගත්-

(i) ආනයනය කිරීමේ දී හෝ නිෂ්පාදනය කිරීමේ දී 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නිෂ්පාදන බද්දට යටත් විය හැකිව තිබූ සහ 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ සෙස් බද්දට යටත් විය හැකිව තිබූ, 2014 ඔක්තෝබර් මස 25 වන දිනට නොවිකිණී තොග වශයෙන් ඉතිරිව පවතින සිගරට් ද ඇතුළුව 2014 ඔක්තෝබර් මස 25 වන දිනට පසුව එහෙත් 2016 නොවැම්බර් මස 1 වන දිනට පෙරාතුව ආනයනය කිරීම හෝ නිෂ්පාදනය කිරීම කරන ලද්දේ නම්, එම බද්දට ම යටත්වන සිගරට්; හෝ

(ii) ආනයනය කිරීමේ දී හෝ නිෂ්පාදනය කිරීමේ දී 2022 අංක දරන විශේෂ භාණ්ඩ හා සේවා බදු පනත යටතේ විශේෂ භාණ්ඩ හා සේවා බද්දට යටත් වන සිගරට්;

(ඇ) ආනයනය කරනු ලබන හෝ සපයනු ලබන, රේගු කාර්ය සඳහා සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගත්-

(i) ආනයනය කිරීමේ දී (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත යටතේ පනවා ඇති රේගු බද්දට සහ (52 වන අධිකාරය වූ) නිෂ්පාදන බදු ආඥාපනත යටතේ පනවා ඇති නිෂ්පාදන බද්දට සහ 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ පනවා ඇති සෙස් බද්දට යටත් වන 2014 ඔක්තෝබර් මස 25 වන දිනට නොවිකිණී ඉතිරිව පවතින සහ 2014 ඔක්තෝබර් මස 25 වන දිනට පෙරාතුව ආනයනය කර හෝ නිෂ්පාදනය කර ඇති මත්පැන් ඇතුළුව 2014 ඔක්තෝබර් මස 25 වන දිනට පසුව ආනයනය කිරීම හෝ නිෂ්පාදනය කිරීම කරන ලද්දේ නම් එම රේගු බද්ද, නිෂ්පාදන බද්ද සහ සෙස් බද්දටම යටත් විය හැකිව තිබූ මත්පැන්; හෝ

(ii) ආනයනය කිරීමේ දී හෝ නිෂ්පාදනය කිරීමේ දී 2022 අංක දරන විශේෂ භාණ්ඩ හා සේවා බදු පනත යටතේ විශේෂ භාණ්ඩ හා සේවා බද්දට යටත්වන මත්පැන්.”.

4. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව